3001,

17
07/10



බෙලිගල් කෝරළයේ පොදුජන ඇදහිලි
ය
විශ්වාස එහි සමාජ රටාව තෙරෙහි
බලපෑම ආකාරය පිළිබඳ
නිබන්ධනයකි.

----------// ----------

ලියා පදිංචි අංකය: ඒ 5512.

122851

පටුන.

1. බෙලිගල්කෝරළය හැඳින්වීම. . . . . 1 - 41

බෙලිගල්කෝරළයේ භූගෝලීය- ඓතිහාසික- සංස්කෘතික ආර්ථික හා දේශපාලන පසුබිම.

අ. භූගෝලීය පිහිටීම.

ආ. දේශගුණය.

ඇ. ජනගහනය.

ඈ. ආර්ථික රටාව.

ඉ. පරිපාලනය.

ඊ. අධ්‍යාපනය.

උ. ඓතිහාසික විදගත්කම.

ඌ. සංස්කෘතික වශයෙන් ඇති විදගත්කම.

එ. සංවර්ධන ව්‍යාපාර.

/11/ මූලාශ්‍ර හා ආශ්‍රිත ග්‍රන්ථ විස්තරය.

1 පළමුවන පරිච්ඡේදය. . . . . 42 - 78

උපත- වැඩිවිය පැමිණීම- විවාහය, මරණය, පිළිබඳ විශ්වාස

2. දෙවන පරිච්ඡේදය. . . . . 79 - 92

කෘෂිකර්මය හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාස.

3. තුන්වන පරිච්ඡේදය. . . . . 93 - 107

දෙවිදේවතාවුන් පිළිබඳ විශ්වාස.

4. සිව්වන පරිච්ඡේදය. . . . . 108 - 126

අභිචාර විධි.

5. පස්වන පරිච්ඡේදය. . . . . 127 - 138

පේනකම, අංජනම් හා නැකැත් පිළිබඳ විශ්වාස.

6. හයවන පරිච්ඡේදය. . . . . 139 - 148

බෙලිගල් කෝරළයේ ඇදහිලි හා විශ්වාස කෙරෙහි හින්දු බලපෑම්.

7. ආශ්‍රිත ග්‍රන්ථ . . . . . 149 - 150

8. යම්කිසි සාකච්ඡා සඳහා සහභාගි කරගත් අයගේ නාම ලේඛනය. 151 - 158

9. බෙලිගල් කෝරළයේ භූගෝලීය හා සංස්කෘතික සිතියම් දෙක දැක්වෙන පිටු. - 159.

බෙලිගල්කෝරළය හැඳින්වීම.

බෙලිගල්කෝරළයේ භූගෝලීය ඓතිහාසික සංස්කෘතික ආර්ථික හා දේශපාලන පසුබිම:-

අ. භූගෝලීය පිහිටීම:- උත්තර අක්ෂාංශ 7.05 සිට 7.20 හා
නැගෙනහිර දේශාංශ 80.09 සිට 80.20 දක්වා
අතර කලාපයේ පිහිටි බෙලිගල්කෝරළය යතර
කෝරළයෙන් විශාලම කෝරළයලෙස සැලකේ මෙය දිවයිනේ බටහිර කාර්තුවට වන්නට
නිරිත දිග තෙත් කලාපයේ උතුරු කොටස තුල පිහිදී පවතී.

ස්ථානීය පිහිටීම අනුව බලන විට උතුරින් මහ ඔයත් නැගෙනහිරින් නාඋගල හා
දික්කන්ද උස්බිම් තිරුත් දකුණින් දුනුමාලේ මහකන්ද හා කරපිටකන්දත් බටහිරින් තුල්හිරිය
නාන්ගල්ල, අබේපුර්ස, දුම්මලදෙනිය, වරාගොඩ, ගොඩපොල, හා පිටියකන්ද වැනි ගම්
තිරයනුත් මායිම් කොට අතර කලාපය තුළ පැතිරී ඇති මෙයට වර්ෂා සැ: 133 පමණ බිම්
ප්‍රමාණයන් අයත් වේ. බටහිර වෙරළබඩ කැණි බිම් තිරයන් නැගෙනහිර මධ්‍ය කඳුකර
කලාපයන් අතර වැතිර සිටින, අඩි 500- 1500 දක්වා උන්නතාංශයකින් යුත් වියඹ ගිණිකොන
දෙසටනැඹුරුව විහිදෙන උස්බිම් තිරුවෙහි භූ: දර්ශනයේ විශේෂ ලක්ෂණයකි . නැගෙනහිරින්
පිහිටි මධ්‍යකඳුකරය දෙසට යත්ම මේ වැනි තිරයන් උන්නතාංශයෙන් වැඩිවන ආකාරයක්
දැකිය හැකිය. බටහිර මායිම් ආසන්නයේ අඩි1100 ට නොවැඩි උසක් පෙන්නුම් කරන මේ
වැටී මුදුන් නැගෙනහිර ගිනිකොන සීමාවන්හිදී අඩි 1250 කට වැඩි උසකින් යුක්තවීම එයට
සාධකලෙස දැක්විය හැකිය. නැගෙනහිරින් පිහිටි දික්කන්ද පදනම් කොට ගත් මුදුනක් වන
මානගල /අඩි 1322 / උපරිම උසක් දක්වයි. බෙලිගල් කෝරළයේ වැඩි ප්‍රදේශයක්
පුරා විකිදුණු මේ උස් බිම් තිරයන්හි දැකිය හැකි තවත් විශේෂ ලක්ෂණයක් නම් උතුරු මායිම්
කරා ලංවන්ම ඒවා උන්නතාංශයෙන් අඩි 500- 1000 අතර දක්වා අඩු වීමය. කෝරළයේ
උතුරු මායිම විහිදී පවත්නා මහ ඔය උතුරු දකුණ විහිදෙන බොහෝ දුරට රැළි බිම්
ස්වරූපයක් ගන්නා. මේ දර්ශනය සහිත බිම් තිරය ඔස්සේ බටහිර දෙසට ගලා බස්කෝරළයට
මායිම්වූ උස්බිම් තිරු මහ පිහිටි පාෂාණ උද්භූතයන්හි පැරණි කෝරළ මායිම් සේ සම්මත
බෙලි ඵල හා සයරු[1] කොටා ඇතැයි සඳහන් වේ. මේ උස් බිම් තිරයන්ට සමාන්තරව
ඒ ආසන්න විහිදුණ පටු නිම්න බිම්ද වේ. භූ: දර්ශනය තුළ දැකිය හැකි තවත් විශේෂ
ලක්ෂණයකි, උතුරු මායිමට ආසන්නයේදී මෙම නිම්න කුඹයෙන් පල්වී විහිදේ.

---

1. සබරගමු කෝරළය - ශ්‍රී සාලිස්ස හාමුදුරුවෝ.

නැගෙනහිර උස්බිම් තීරය දෙසින් පිටිසි තෝරළයේ උතුර මායිම කොට ගලා බස්නා මහඔය හා ශාඛා මෙහි ප්‍රධාන ජල වහන ලක්ෂණයයි හෙල් වැටී තීර බැස්සේ විහිදුන අඛණ්ඩගාමී තීරයක් නිම්න පදනම් කොටගත් කුඩා ජල ශාඛා ප්‍රශාඛා උතුරට ගලාගොස් මහඔය සෘජ බිඳක්වේ. නැගෙනහිර උස් බිමෙන් පිටිසි ගලා ගමු ඔයද සම්බන්ධ කර ගනිමින් ප්‍රදේශය හරහා උතුරට ගලා යන කැහුල ඔය එවැන්නකි. නැගෙනහිර උස්බිමෙන් පිටිසෙන අලපලා ඔයද, දැදිගම් ඔය හා නෙළුන්දෙණි ඔය සමඟ එක්ව ප්‍රදේශය මධ්‍යයේදී කඳු වැටී තීරයන්ට සමාන්තරව හෙල්වැටී අතරින් ගලා බස්නා ගැරුගොඩ ඔය හා සම්බන්ධ වී ප්‍රදේශයේ දකුණු මායිමෙන් පිට වී යයි. මෙහි උස්බිම් අතරින් බිහිවූ කුඩා දිය-කඳුරු රැසක්ද පටු ගැඹුරු මිටියාවත් ඔස්සේ ශාඛීක හා ජාලීක රටාවලින් සැරසී ප්‍රධාන දියඇළි හා සම්බන්ධ වේ.

තවද, රසායනික ගුණයෙන් පොහොසත් දිය දරණ ගැඹුරු රතු ලටොසෝල් පසින් හා නොමේරූ දුඹුරු ලෝම්පසින්ද මේ ප්‍රදේශයේ වැඩි බිම් කොටසක් වැසී ඇති අතර නිම්න බිම් සියල්ලක්ම නව දියලු පසින් වැසී ඇත.

/ආ/ දේශ ගුණය:- මෙහි දක්නට ඇත්තේ වියලි කලාපයත් තෙත්-කලාපයත් අතර පරිවර්තන ලක්ෂණ පෙන්නුම් කරන දේශගුණයකි. අවුරුද්දේ සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 60- 90 පමණ වන අතර වාර්ෂික උෂ්ණත්වයේ සාමාන්‍ය පෑ 75"-80 පමණ වේ ක්‍රමයෙන් අඩුවෙමින් යන නිරිත මෝසම් මගින් වැඩි වර්ෂාපතනයක් ලබන මේ කලාපයේ උපරිම වැසිකාලදෙකක් වේ. :-

එනම් අප්‍රේල්- ජූනි හා ඔක්තෝම්බර්- නොවැම්බර්ය මෙම දේශගුණික ලක්ෂණ නිසාම දැඩිතෙත් බවින් හෝ අඳුසුමින් නොමිරිකි අවුරුද්ද පුරා වැඩෙන සදා හරිතවත් වන කෙත් වලින් බෙලිගල් කෝරළය වැසී ඇත. දිය මං පෙත් අසල හා හෙල් වැටී වසා තන්හි තන්හි සතව වැවුන වනාන්තර තිරූ හැරුනවිට අද මේ වන පෙත් වලින් බොහොමයක් වීනිසා, වීසින් හිත්වචනු ලැබ ආරථික හා ආහාර බෝග වගා කිරීම සඳහා යොදවා ඇත. අතරක් නොතකා නිල්වන් වනපෙත් වලින් සෙවන ලැබ කෙත් සිහිල් සුළඟින් සුව එලවන කාලගුණික ලක්ෂණ මෙහි පරසරය තුළින් නිතර දැකිය හැකියයි කිවහොත් එය අතිශයෝක්තියෙක් නොවේ. නැගෙනහිරට යම්ම මේ ලක්ෂණය පැහැදිලිව දැකිය හැකිය.

ආ. ජනගහණය :-

දිවයිනේ ජනගහණයෙන් වැඩි කොටසක් සංචිතව ඇති බ වහිර කලාපය තුළ පිහිටි මේ ප්‍රදේශයේ ජනගහණ ව්‍යාප්තියේදී භෞතික දේශගුණික ලක්ෂණ වලදී මෙන්ම ක්‍රියාන්විති කලාපයෙහි ලක්ෂණ මතු කෙරේ. වෙරළ බඩ බිමී තිරුයේ පැතිරී පැවති නාගරික ජන සංචිත මේ ප්‍රදේශයේදී විසිරී යාමත් එම ජන සනත්වය තුනී වී යාමත් එවැනි ක්‍රියාන්විති ලක්ෂණයි. මෙහි ජන ව්‍යාප්තිය සාමාන්‍යයෙන් වර්ග සැ : 1 0500- 1000ප පමණ වේ.

ජනාවාස රටාවෙහි දී ද බහුලව දක්නට ලැබෙන්නේ ගැමී ජනාවාසය. නිවින බිමී හා හෙල් වැටී සිර තුල එකිනෙකට යා බඳව විහිදී ගිය ගම් රාශියක් බෙලිගල්-කෝරළයේහී පිහිටා ඇත. මේවා එකි නෙකට ආවේණික භෞතික, සංස්කෘතික රටාවන්ගෙන් සැකසී තිබේ. ප්‍රදේශය පුරාම ව්‍යාප්තව ගිය වතු ජනාවාසයන් රසක්ද අපට මෙහිදී හමුවේ. යුරෝපීය වැවිලි කරුවන්ගේ පාලනයෙන් පීදී මෑතකදී රජයේ පාලනය යටතේ පවත්වාගෙන යනු ලබන වතු කිහිපයක්හී තුළම මේ වතු ජනාවාස ලක්ෂණ දැකිය හැකිය. ඔරේන්ජ්ග්‍රෝව් වත්ත ඇටිනාවල වත්ත ඉන් සමහරකි. මෙම වතු ජනාවාස බොහෝ දුරට සකස්ව ඇත්තේ වතු කම්කරුවන් වශයෙන් සේවයේ යෙදී සිටින ද්‍රවිඩ ජනතාවගෙනි. ඔවුන්ට අත්‍යවශ්‍ය සේවාවන් බොහෝමයක්ම මේ ජීනාවාස තුළ දක්නට ලැබේ. වතු වටා විහිද ගිය බිම්වල පිහිටි කුඩා ගම්මාන සියල්ලක්ම ස්වදේශික ජනතාවගෙන් සමන්විතය.

ප්‍රදේශය හරහා විහිදයන ප්‍රධාන රථවාර්ග පදනම් කොටගත් තවත් ජනාවාස විශේෂයක් මෙහි දක්නට ලැබේ. ඒවා රේඛීය ජනාවාසය. මේ ජනාවාස තුළ ජීන-ගහණය ජාතීන් කිහිපයකගේ සංකලනයකි. වෙළඳාම වැනි ජීවනෝපාය මාර්ගයන්ගී හැඩ ගැසුන මොවුහු සිංහල, දෙමළ හා මුස්ලිම් යන ජාතීන්ට අයත් වෙති. දිවයිනේ විවිධ ප්‍රදේශ-යන්හි සිට සංක්‍රමණය වුවන්ද මොවුහු අතර දක්නට ලැබෙයි. මේ රේඛීය ජනාවාසයන්ගෙන් වැඩි කොටසක් දක්නට ලැබෙන්නේ කොළඹ, මහනුවර, දක්වා විහිදෙන ප්‍රධාන රථවාර්ගයේ සහ කොළඹ- කුරුනෑගල මාර්ගයන් ආශ්‍රයෙනි. මේ මාර්ග ඇසුරෙහිම සිදුවෙන් සංවර්ධන වන නාගරික ජනාවාසද තන්හි තන්හි දක්නට ලැබේ. කෝරළයේ විවිධ ප්‍රදේශයන්හි සිට ජලාකාරව ඇදී එන සුළු රථවාර්ග සම්බන්ධ කොට ගන්නා මිසන්ධි නගර ලෙසද මේවා හැඳින්විය හැකිය.

වරකාපොල, හෙට්ටිදෙණිය, ගලිගමුව, අඹන්පිටිය, කොටියාකුඹුර, අලවිව හා මුලස්කොඩු පිටිය එවැනි නාගරික ලක්ෂණ ගන්නා ජනාවාසයන්ය. පාඨැල, රෝහල, තැපැල්හල, විවිධ ආගමික සිද්ධස්ථාන හා ජනතාවට සේවා සපයන තොයෙකුත් ආයතන වලින් මේවා යුක්ත වේ. තේ, පොල්, රබර් ආදි වාණිජ භෝගයන්ගේ ව්‍යාප්තියත් සමඟ මේ නාගරික ඒකකයන්ගෙන් ඇත පිහිටි ගැමි ජනාවාසයන්හිද අද සංස්කෘතික භූදර්ශනය ත්‍රීයෙන් වෙනස් වෙමින් පවතින අතර නාගරික ජනසාමූහිකයන් සමඟ සබඳතා ගොඩ නගා ගැනීමට ගැමියෝ යුහුසුළු වෙති. එම සබඳතා බොහෝ විට වාණිජ ස්වරූපයකින් යුක්තය. බෙලිගල්කෝරළයේ වැසියන්ගේ නිෂ්පාදන එකතු කරන එමෙන්ම ඒ වැසියාට අවශ්‍ය භාණ්ඩ හා සේවා බෙදාහරින මධ්‍යස්ථාන වශයෙන්ද මේ නගර සැලකිය හැකිය.

මුළු දිවයින තුලම පොදුවේ දක්නට ලැබෙනවා සේම බෙලිගල්කෝරළය තුළද දක්නට ලැබේ. මෙහි ජනගහනයෙන් වැඩි කොටසක් ගැමි සිංහලයන් වන අතර, දෙමළ හා මුස්ලිම් යන සුළු ජාතීහු ද තනිව තනිව සංචිතව සිටිති. කෝරළය පුරාම ව්‍යාප්තව පවතින වතු ජනාවාසයන්හි ජනගහනයෙන් වැඩි කොටසක් ඉන්දියානු ද්‍රවිඩ කොටස්වලින් -ය. මේ හැර නාගරික ජනාවාසයන්හි ලාංකික ද්‍රවිඩ කොටස් වාණිජ කටයුතු වල නියැලී සිටිති. අලවිව එවැනි ජන කොටස් වලින් සමන්විත කුඩා නගරයකි. නාගරික ජනාවාසයන්හි වාණිජ කටයුතු වල නියැලී සිටින ජනයාගෙන් වැඩි කොටසක් මුස්ලිම් ජාතිකයන් වන අතර මොවුන් පරම්පරාවේ පදිංචි වී සිටින ගම්මිණිසුන්ද වේ. වරකාපල, හෙට්ටිදෙණි යන නාගරික එකක වලට උදාහරණ වශයෙන් දැක්විය හැකිය. පොදුවේ මුළු කෝරළය තුලම අධික ජනඝනත්වයක් දක්නට ලැබෙන අතර ඒ නිසාම පාලනයහා අනෙකුත් කටයුතු පහසු කිරීම සඳහා කෝරළය ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. ඒ බෙලිගල් කෝරළය නැගෙනහිර හා බටහිර වශයෙනි. කෝරළය පුරා විසිර පවතින ගම් 250 කින් 122 බෙලිගල්කෝරළයේ නැගෙනහිරද අනෙක් 128 බටහිර කලාපයටද අයත් වේ. මේ ප්‍රදේශ දෙකෙහි ජනගහන ව්‍යාප්තියද සංසන්න වාර්තාවන්ට[1] අනුව මෙසේය.

වර්ෂය	බෙලිගල්කෝරළය නැ: මුළු ජ: සංඛ්‍යාව	බෙලිගල්කෝරළය බටහිර මුළු ජන සංඛ්‍යාව
1975	76732	90556
76	77507	91470
77	78057	92135
78	78635	9280

1 සිංහල්ල කොවේඩ්ගේ ජන සංගණන ඇංශයේ 1975-76-77-78 වර්ෂවලිනුත් වාණි මුල්ලිත් සැකසීකරගත් තොරතුරු ලදී.

වර්ග සැතපුම් 58.6 තරම් විශාලත්වයකින් යුක්ත බිම් ප්‍රමාණයක් සහිත බෙලිගල්කෝරළයේ බටහිර ට වඩාත් ඉහෙනිර විශාලත්වයෙන් මෙන්ම ජනගහණයෙන්ද වැඩි වන අතර එහි වර්ග ප්‍රමාණය වර්ග සැ: 74.9 පමණ වේ. අද ක්‍රමයෙන් නව්කරණයට භාජනය වීම නිසා මෙහි ගතිලක්ෂණ සංස්කෘතික භූ:දර්ශනයේ වෙනස් කම් රාශියක් පිදුවී ඇත. වනගත බිම් රාශියක් සාරවත් කෙත්වත් බවට පත්කොට තිබේ. තුල්හිරිය වැනි නව කාර්මික සංකේන්ද්‍රනයන් නිසා ජනගහණයටද ක්‍රමානුකූල ජන කොටස්ද එක් වී ඇත. එහෙත් මෙහි වාසය කරන ජනතාව තුළට නිවීකරණය වැනි හැඟීම් පිවිසී ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. කුල ක්‍රමය වැනි වැඩවසම් සමාජ සංකල්ප තවමත් මෙහි දැඩි ලෙස දක්නට ලැබේ. ආවේණික කෘෂි ජීවන රටාවෙන් මිදී යාමට හෝ එයට නවාංග එකතුකර ගැනීමට තරමිවත් උත්සාහ නොගන්නා ජන කොටස් තවමත් මෙහි දැකිය හැකිය. තමා සතු කුඩා ඉඩම් කැබැල්ලකින් හෝ කුඹුරු කැබැල්ලකින් ලබා ගන්නා අවම ආදායමෙන් පූර්ණ තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට හැකියයි සිතන ඔවුන් සමාජයේ නව සිතුවිලි දෙස බලා සිටිනුයේ උදාසීන හැඟීමවලිනි. මේ නිසාම බෙලිගල්කෝරළය සම්ප්‍රදායෙන්ම ගම් සහ ගැමි ජනාවාස සහිත පරිසරයෙන් නොමිදී පැරණි ගැමි පිරිසක් සුරකින පියස්සක් වැනි යයි සිතිය හැකිය.

ඇ. ආර්ථික රටාව:-


බෙලිගල් කෝරළයේ ආර්ථික කටයුතු සියල්ලම වාගේ සකස්වී ඇත්තේ කෘෂිකර්මීය පදනමකිනි. ඉතාම පැරණි යුගයේ සිට පුළුල් දිවයිනටම පොදු ලක්ෂණයක් වූ මෙය ආර්ථික කටයුත්තකට වඩා ජීවනෝපාය ක්‍රමයක් විය. යුරෝපීය ආධිපත්‍යයට භාජනවීමත් සමඟ ලාභදායක නොවන මෙම කෘෂිකර්මීය වෙනස්වී ගොස් තේ, පොල්, රබර් වැනි ආර්ථික භෝගයන් වැදගත් තැනක් ගත් කෘෂිකාර්මික ප්‍රවාහකට ජනයා අවතතවූ ආකාරය ඉතිහාසයෙන් මෙන්ම ලක් බිමෙන්ද අපට පැහැදිලි වේ. අද බෙලිගල්කෝරළයතුළ දක්නට ලැබෙන්නේමේ විපර්යාසයන්ගෙන් අත්වැල් බැඳගත් කෘෂිකාර්මික රටාව වන අතර එය කොටස් කිහිපයකට බෙදා මෙසේ විස්තර කළ හැකිවෙයි.

අ. ප්‍රධාන ආහාර භෝගයවන වී වගාව

ආ. ගේන් ගොවිතැන,

ඇ. සතුන් ඇතිකිරීම,

ඈ. ආර්ථික භෝග වගාව.



දිවයිනේ ප්‍රධාන ආහාර භෝගය ලෙස සැලකෙන වී වගාව පැරණි යුගයේ සිටම මේ ප්‍රදේශයට ආවේණික ජීවනෝපාය ක්‍රමය ලෙස සැලකිය හැකිය. උස් භූමිභාග සිට අඳිහැලෙන දිය කඳුරින් පෙගුන මීටියාවත් හා තුනී බීජී සියල්ලන්ම පාහේ මේ වගාවට යටවී ඇතැයි කිව හොත් එය අතිශයෝක්තියක් නොවේ. වී වගාව සඳහා අවශ්‍ය කරනු ලබන භෞතික දේශගුණික සාධක උපරිම අයුරින් සැලසී නැතත් අහස් ජලය වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගෙන අවුරුද්දේ මෝසම් දෙකකට අනුව වගා කටයුතු කිරීමට මෙහි වැසියෝ පුරුදුව සිටිති. එය යල් සහ මහ කන්න වශයෙන් හඳුන්වනු ලැබේ. සැප්තැම්බර් සිට මාර්තු දක්වා යල් කන්ද මාර්තු සිට සැප්තැම්බර් දක්වා මහ කන්නද සැලකේ. මෙයින් ප්‍රධාන වගා කන්නයෙහි මහ කන්න වැදගත් වන අතර වර්ෂාපතනයේ අවිනිශ්චිතතාව වැනි කරුණු හේතුකොට ගෙන සමහර තැනෙක යල් කන්නයේ වගා කටයුතු පිළිබඳ වැඩි අවධානයක් යොමු නොකෙරේ. මෙහි ගොවියා විසින් වී වගාව සඳහා හඳිනා කරන ගොවිතැන් ක්‍රම බොහෝ වීට පැරණි ස්වරූපයෙන්ම යුක්තය. නූතන ක්‍රම හා සසඳන විට ලබාගන්නා අස්වැන්න ප්‍රමාණය එතරම් සතුටුදායක යයි කිව නොහැක්කේ උපයනු ලබන අස්වැන්න ගැන පොදුවේ සලකා බලන විට අතිරික්තයක් තබා පරිභෝජනය සඳහාවත් නෙස ගෙන තරම්ය. මෙවැනි තත්වයක් උදාවීම කෙරෙහි විශේෂ හේතු රැසක් දැක්විය හැකිය.

විශේෂයෙන් බෙලිගල්කෝරළය වැසියා තවමත් ආවේණික පැරණි ගොවිතැන්-ක්‍රම වල එල්බ ගෙන සිටීම එක් හේතුවක් ලෙස දැක්විය හැකිය. නූගත්කම දිළිඳුකාවය වැනි කරුණු නවීනකරණය අනුගමනය කිරීමේදී ඔවුන් ඉදිරියේ ඇති බාධා ලෙස සැලකිය හැකිය. ස්වභාව ධර්මයේ දඩුවම් ලෙසද අස්වැන්න විනාශ කිරීමේ උවදුරු ඔවුන් ඉදිරියට පැමිණෙති. වසරක් පාසා බොහෝවිට සිදුවන ගංවතුර හා නිඟ ඉන් ප්‍රධාන තැනක් ගනියි. කන්නයේ අස්වැන්න කෙරෙහි ද බෙහෙවින් බලපාන කෘෂිවසංගත තවත් එවැනිම තර්ජනයකි. මෙවැනි උවදුරුවලින් මිදීමට ඇති නූතන උපක්‍රම වන කෘෂිනාශක භාවිතය වැනි දෑ කෙරෙහි දක්වනු ලබන උනන්දුව තවමත් ආගමික භක්තිය නිසින් බැඳී තබා ඇත. අද වුවද බෙලිගල්කෝරළයේහි වසන ගෝවියන්ගෙන් වැඩි දෙනකු තම ගොවිතැන් වලට වන ගංවතුර නියඟ කෘමි වසංගත වැනි උවදුරු දේව ශාපයක ප්‍රතිඵලයක්ලෙස උකහමට පැලී නොවෙති. වසරක් පසා පාරම්පරික උරුමය මත කුඩා වෙමින් බෙදී යනකුදා කුඹුරක අස්වැන්නෙන් ක්‍රමයෙන් වියහැලවන පවුලක පාරිභෝගික අවශ්‍යතා පිරිමැසීම කෙසේවත් කළ නොහැකිය.

නව රසායන පොහොර හා තුම ශිල්ප තාවිතයෙන්වත් මකාලිය නොහැකි මෙවැනි හැඟීම් මතුයේහි බෙලිහල් කෝරළයේහි කෙරෙනවී ගොවිතැන පරිහෝජන අවශ්‍යතාවයන්ගේත් නොසැලෙන තරමිය.

ඇත අතීතයේ සිටම බෙලිහල් කෝරළය තුළ ව්‍යාප්තව පැවති හේන් ගොවිතැනද ජීවනෝපාය තුමයේ තවත් අංගයක් ලෙසට සැලකිය හැකිය. පැරණි ඇදහිලි හා සිරිත් විරිත් පදනම් කරගනිමින් අදත් තන්හි තන්හි මේ ගොවිතැන් තුමය දක්නට ලැබේ. එහෙත් අද මෙහි සමහර ලක්ෂණ වෙනස් වෙමින් පවතින අතර ඒවා නූතන ආර්ථික රටාව පෝෂණය කිරීමටද පිටිවහලක්වී ඇත.

ප්‍රදේශය පුරා පැතිරුණ වන බිම් පදනම් කරගත් ගොවිතැන් තුමයක්ව ත මෙය එම වනපෙත් හෙළිකළ ගොවියාගේ පාරිභෝගික අවශ්‍යතා පිරිමැසූ වගා තුමයක්ද විය. කුරක්කන්, අඹු, මෙනේරි වැනි විශේෂ ධාන්‍ය සහ මයියොක්කා, අල, බතල, ලබු, පුහුල්, කීරිස් වට්ටක්කා, වැනි දෑද වගා කිරීම මේ හේන් වගාවෙහි ප්‍රධාන ලක්ෂණය වූ අතර ගොවි පවුලෙහි සහලින් නොපිරිමැසුන අතරවාරයන් පිරිමසා ගැනීම යැදහා මේ ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනී.

පෙබරවාරි අගෝස්තු වැනි කෙටි කාලීන සෘතු ප්‍රයෝජනයට ගෙනෙකැලෑකපා ගිනිතැබීමෙන් පසු වගාවන් ආරම්භ කිරීමට මෙම ගොවියා පුරුදුව සිටියේය. එහෙත් අද මෙම තත්වය වෙනස් වී ගොස් රබර් වැනි ආර්ථික බෝග සිටුවීමට පෙර කරනු ලබන වුලික වගාවක් ලෙස හේන් ගොවිතැන කෙරෙයි ආර්ථික වශයෙන් කරනු ලැබූ වගාවෙහි පැල මෝරා වැඩෙන තුරුම එම අතුරු වගාවන් ලෙස මත්තොක්කා, අල, බතල ආදිය මෙන්ම බටු වට්ටක්කා, පුහුල් ආදි වගාවන් කරගෙන යනු ලබනත් මෙයින්ස ර්ථික ප්‍රතිඵල ලැබිය හැක්කේ එක් කන්නක හෝ දෙකක පමණි. මේ අනුව සකස් කරනු ලැබූ හැම හේනක්ම අද රබර් හෝ පොල් සහිත කුඩා ඉඩමක් බවට පත්වී ඇත. වන පෙත් තුමයෙන් ගි- හිනවී යන අතරඒ හේතුකොටගෙන මතුවන නොයෙකුත් භෞතික හා දේශගුණික දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය හැකිය.

පරිභෝජනයේදී දී මතුවන නොයෙකුත් ප්‍රශ්නාවලියන් මෙහෙරව, ගැනීමේ අරමුණින් යුතුව මෙහි වැඩියා අතුරු කාලයකදී තවත් අතුරු තොරතුරු කුමයක් අනුගමනය කරයි. ලා ගොයම් නිල්ලෙන් කුඹුරු වැසි යාන සමයෙහි ඒ වටා පිහිටි පටු දෙණිකඩ හානියෙන් බඩවැටී ආදියෙන් ප්‍රයෝජනයට ගෙන ඒවායේ කෙසෙල් එළවළු ආදිය සිටුවති. මේ අතර වාරයන්හි බුලත්වැනි අතිරේක බෝගයන්ද වවති. මලින් හා පලතුරින් පිරුණු ගෙවතුන් පිළඹඳ ඇත අතීතයේ සිටම බෙලිගල්කෝරළය ප්‍රසිද්ධ වුයේ මේ හේතුවෙයි සිතිය හැකිය. අද වුවද දැකිය හැකි මල් පලින් පිරුණු ගෙවතුන් වේ. අතුරු වගාවේම ප්‍රතිඵලයයි සිතිය හැකිය. මේ කෘෂිකර්ම කටයුතු සියල්ලක්ම පාරේ ගෙන බලන විට පැහැදිලි වනුයේ බොහෝ දුරට ආර්ථික ලාභ තකා නොව පාරිභෝගික අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමේ කුම භැටියටය. ඉඩම් පරිභෝජනයේදී ඇති විවිධත්වය නිසා අතිරික්තයක් සහිත කෘෂි කටයුතුවල නියලීමට හැක්කේ කිහිප දෙනකුට පමණි. ගම්වැසියන්ගෙන් බොහෝ දෙනෙකු ඉඩම් හිඟය වැනි ප්‍රශ්න හමුවේ ජීවනෝපාය මාර්ගයක් නොමැතිව අසරණවී සිටින අතර එදිනෙදා ලැබෙන කුලි වැඩකින් ජීවිතය ගෙවා ගැනීමට ඔවුන්ට සිදුවී ඇත. පොදුවේ මුළු කෝරළයේම වසන විශාල ජනගහණයකට පිහිටවී ඇත්තේ රජයේ හෝ වෙනත් නිලධාරීන් යටතේ වෘත්තීය ඇති ස්ථිර යෝගයන්ගෙන් යුත් වතුය. මෙයිනුත් බෙලිගල්කෝරළය පුරාපැතිරී ඇත්තේ රබර් වතාවන්ය.

ආර්ථික හෝග පදනම් කොටගත් කෘෂිකර්මය අද බෙලිගල්කෝරළ වාසින්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් සේ සැලකිය හැකිය. මේ ආදායම් ප්‍රධාන කොටස් දෙකකට බෙදා සාකච්ඡා කළ හැකි අතර ඒවා මෙසේ දැක්විය හැකිය.:-

1. ඉඩම් හිමියන්ගේ රජයේ පාලනයට නතුව පවතින වතු.
2. කුඩා ඉඩම්.

මුලින් සැදින්වූ වතු සංඛ්‍යාවෙන් අක්කර 500ට වැඩි විශාල වතුවේ මෙයින් සමහරක් යුරෝපීය වැවිලිකරුවන්ගේ ආධිපත්‍යයෙන් මිදී මෑතකදී රජයේ පාලනය යටතේ පවතින ඒවා වේ. ඉඩම් හිඟයෙන් පෙළෙන දිරිද්‍රු ගැමියන් සහ ද්‍රවිඩ කම්කරුවන් විශාල කොටසක්මේ වතුවල සේවය කරමින් එම වැවුපින් ජීවත්වීමට උත්සාහ දරති. මේවා ත්‍රිවිත්ව වගාකරන ලද වගා බිම් වන අතර නව ක්‍රම භාවිතය, පොහොර යෙදීම ආදියෙන් තුමයෙන් උපරිම ප්‍රයෝජන ලබති. මේ කෝරළයේ වැසියාට ආර්ථික විෂයෙන් විශාල සේවයක් මේ වතු මගින් ඉටුවේ.

ආර්ථික බෝගයන් සඳහා වැයකරන ලද අක්කර 1-30 පමණ දක්වා විශාලත්වයන්ගෙන් යුත් කුඩා ඉඩම් රාශියක් බෙලිගල්කෝරළයේ හැම ගමකම දැකිය හැකිය. මේවා විශේෂයෙන් වැයවී ඇත්තේ පොල්, රබර්, කරාබු සහ තෝපි වගාවට වනු අතර කොස් දෙල් හා නාරං, කජු වානාදියද අතුරු බෝග ලෙස වවා ඇත. හැම ආර්ථිකයේ විශේෂ ස්ථානයක් මේ කුඩා ඉඩම් වලට ලැබෙන අතර ඔවුන් සියලුම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට මේ වතුවලින් ලැබෙන ආදායමේ පිහිට පතති .මෙය ඔවුන්ගේ ස්ථාවර ආදායම් මාර්ගයක් ලෙසද සැලකේ. මෙවැනි වතුවල වගාවන් බොහෝ විට ඉඩම්හිමියාගේ ශ්‍රමයෙන් කෙරෙන අතර අස්වැන්න එකතු කිරීම පවා කරනුයේ ඔහු විසිනි. මෙවැනි ඉඩම් ඇසුරෙහි කෙරෙනොයෙක් අතුරු වගාවන්ගෙන්ද ප්‍රයෝජන ගැනීමට මේ ඉඩම් හිමියන් හැම විටම උත්සාහ දරති. කහ සහ ඉඟුරු වගාව මේ ය ඵෂත් පොල් වත ඉඩම්වලකදේ. නූතන නව ක්‍රම භාවිතයෙන් කෘෂිකර්මීයේ නවමං කොයා යන මේ ඉඩම් හිමි ගැමි පිරිස එමගින් ස්ථාවර ආදායම් මාර්ග සලසා ගැනීමට උත්සාහ දරති.

කෘෂිකාර්මික කටයුතු වලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ගව මීහරක් වැනි සතුන් ඇති කිරීම ආදියේහි සිටම සිංහල ගැමියාගේ ආර්ථික ක්‍රමය තුළ දක්නට ලැබුණ විශේෂ අංගයක් විය. බෙලිගල් කෝරළයේහි පිහිටි හැම ගමකම වාගේ මෙම ලක්ෂණය තවමත් නොනැසී පවතින අතර එයට නවාංග එකතු කරමින් අද ස්ථාවර ආර්ථික ක්‍රමයක් සලසා ලන මාර්ගයක් ලෙස යොදා ගැනීමටද කටයුතු කෙරේ. කුඹුරෙහි සි සෑම ආදි කටයුතු පිරිමසා ගැනීමටත් එදිනෙදා නිවසට අවශ්‍ය කිරි ටිකසපයා ගැනීමත් කරත්තවල බැඳීමත් ආදි පරමාර්ථ කිපයක් සපුරා ගැනීමට පමණි පැරැණින් මෙරට ගවපාලනය කරන ලද්දේ මේ නිසාම නමුත් අද ආදායම් මාර්ග සලසා දෙන සතකු ලෙස ගවයාට සැලකිලි දැක්වීමටත් කැපීබිඳී සපයා දීමටත් බලාපොරොත්තු වුහ. සියවස් ගණනකට පෙර ඉතිහාසය තුළ දකින්නට ලැබෙන මේ සිරිත් තවමත් බෙලිගල්කෝරළ-යේද දක්නට ලැබෙන අතර ඇල, දොළ, ගංගා ආදියේහි ඔවුන් නැවීමත් නිදැල්ලේ ඔවුන් මුදාහැර තැබීමත් තවමත් ශ්‍රීලබ දසුන්ය. එහෙත් පැරණි ගොවියා ගවයාගෙන් ලබාගත් ප්‍රයෝජන වලට වැඩි පරිවල අද ගොවියා ලබා ගනී. නූතන සමාජයේ වැඩි ඉල්ලුමට සරිලන අයුරින් සතුන් පාලනය කිරීමට ඔවුහු පුරුදුව සිටිති. නිවසේ ඇති දැඩි කරනු ලබූ දෙනුන් තිහිප දෙනකු ගොවියාගේ දෛනික ආදායම් කර කිරීමට සමත්වී ඇත.මේ අතර කුතුලන් ඇති කිරීමද බහුල වශයෙන් සිදුකෙරේ. එහෙත් මෙය ක්‍රමානුකූලව සකස් කරනුලබූ ස්ථිර ආදායම් මාර්ගයක් ලෙස තවමත් දියුණුවී නොමැත.

ඇත අතීතයේ සිටම පැවත ගෙන ආ මෙම අර්ථ ක්‍රමයන්ට නැඹුරුවූ ජනයා මෙන්ම නව සංවර්ධන ක්‍රම ඔස්සේ ඇතිවන නව අර්ථ ක්‍රමයන් වැළඳ ගන්නා ජනතාවද අද බෙලිගල් කෝරළය තුළ දැකිය හැකිය වැඩ වසමේ සමාජ ආකල්පයන්හි බැඳී පැවති යුගයේ සිට තමාට උපතින් හා උරුමයෙන් හිමිවූයේ යයි සලකා යම් යම් රැකියාවන්හි නියුතු වූ පිරිස්ද මේ අතර දැකිය හැකිය. බටපොතුවිවිම රන්විදි අබරණ සැදීම යනාදී වාණේ බඩු නිෂ්පාදනය වැනි කර්මාන්ත ද එයට උදාහරණ සේ දැක්විය හැකිය. පාරම්පරික කුල ක්‍රමය මත ගොඩ නැගුනමේ රැකියා හැරුණ විට වඩුවැඩ, කොත්තු කර්මාන්තය, රෙදි විවීම වැනි ගෘහ කර්මාන්ත මගින්ද ආර්ථිකයට විශාල පිටුවහලක් ලැබී ඇත. බීඩි නිෂ්පාදනයද අද දක්නට ලැබෙන තවත් ජනප්‍රිය ගෘහ කර්මාන්තයකි.

බෙලිගල්කෝරළයේ ආර්ථිකය පෝෂණය කරනු ලබන තවත් අංගයක් ලෙස බහිජ සම්පත් වලටද විශේෂ තැනක් හිමිවේ. රන්ගල හා බෝගල හිනිරන්පතල් ඉන් ප්‍රධාන තැනක් ගෙන ඇත. මේ පතල් බීඩි අවට වැසි ජනයාගෙන් වැඩි කොටසක් මෙම පතල්හි සේවා සපයන්න වුන්ය. රජය මගින් ගෙනයන සංවර්ධන ව්‍යාපෘති ඇසුරෙන් ගොඩනැගුන කාර්මික ඒකකයන් මගින්ද මෙම ආර්ථිකයට විශාල මෙහෙයක් ඉටු වෙයි. තුල්හිරිය පෙදෙසේ හල එවැන්නකි. දිවයිනේ නන් දෙසින් පැමිණ සේවා යෝජකයින් රසක් මේ කාර්මික මධ්‍යස්ථානය කේන්ද්‍රකොට අවට පෙදෙස්හි පදිංචිව සිටිති.

මේ අනුව බෙලිගල්කෝරළයේ ආර්ථිකය විවිධ පැති ඇසුරෙන් ගොඩ නැගී ඇතත් මෙහි වසන්නන්ගෙන් වැඩි දෙනෙකු තවමත් දිළිදු තැනැත්තන්ය. ස්වයංපෝෂිත ආර්ථිකයක් පිළිබඳ නිරතුරු දකින සිහින මැද ඔවුහු තවමත් අසරණව සිටිති.

ඇ. පරිපාලනය:-

බෙලිගල්කෝරළයේ නූතන පාලන ක්‍රමය ගැන සාකච්ඡා කිරීමට පටන් ගන්නේ එහි අතීත පාලනයේ දසද විමසා බැලිය යුතුය මෙහිදී ප්‍රධාන කොටස් තුනක් යටතේ කරුණු ඉදිරිපත් කළ හැකිය.

අ. පැරණි සිංහල රජවරුන්ගේ පාලනය

ආ. විදේශීය පාලන ක්‍රමය.

ඇ. නූතන පාලන ක්‍රමය.

අනුරපුර යුගයේ සිට පැරණි සිංහල රජුන් යටතේ පැවති පාලනය සියුම්ව විගහ කිරීමක් මෙහිදී නොකරමි. එක් එක් වකවානු තුළ හා නානා පාලකයන් විසින්වීට පාලන රටා හා නීති රීති පිළිබඳ සාකච්ඡා කිරීමට එහිදී සිදුවේ. මා බලාපොරොත්තු වන්නේ එතරම් දිරිස නිබන්ධනයකට කරුණු සැපයීමක් නොව පැරණි සිංහල පාලන ක්‍රමයේ ආයාවක්ගෙන බැර දැක්වීම හා බෙලිගල්කෝරළය තුළ එය කුමන අකාරයෙන් ක්‍රියාත්මක වූයේද යන්න පැහැදිලි කිරීමය.

පැරණී සිංහල රාජ්‍යයේ ප්‍රධාන පාලකයා වූයේ රජ තුමාය සිය කාර්යයේදී ඔහුට ඇමති මණ්ඩලයේ අවවාද අනුශාසනා ලැබී නී. රාජ්‍යයේ යුද්ධ කටයුතු වලදී මෙන්ම පාලන කටයුතු වලද්ද රජ තුමාට තමන් කැමැති පරිදි ක්‍රියා කිරීමේ නිදහසක් තිබිණ. රජුගේ ඇමති මණ්ඩලයේ ප්‍රධානියා වන ඇමති වූ අතර ඒ ඒ පළාත් භාරව අධිකාරීවරු සහ මුදලි වරුද වූහ. ඒ පළාත් භාරව කටයුතු කළ රාජ්‍ය නිලධාරීන්ට සැලෙන තරමක නිදහසක් තිබිණ. එසේ වුවත් ගම්වල පාලනය භාරව සිටී නිලධාරීන්ට විරුද්ධව රජගේ ලේකම් කාර්යාලයට දැනුම්ය හැකිව තිබුණි. මේ බව තුන්වැනි උදයගේ බදුල්ල ටැම් ලිපියෙන් ඔප්පුවේ. ඇතැම් විට සිංහල රජවරුන්ම වෙස්වලාගෙන ගම්වල සැරිසරා ඇති අතර නිශ්ශංක මල්ල, ගජබාහු වැනි රජවරුන් එම ක්‍රමය අනුගමනය කළ බව හෙළිවේ.

රජුගේ පාලන පහසුව සඳහා පළාත් හා ප්‍රදේශ හා ගම් ආදිය පාලනය කිරීමටත් බදු එකතු කිරීමටත් නිලධාරීන් පත්කොට තිබුණි. මේ නිලධාරීන් අතරින් උසස්ම නිලතල ලැබී තිබුණේ උසස් යැයි සම්මත රදළ වැනි කුලවල අයටයි. ඇතැම් සුළු මුලාදැනි තනතුරු පහත් යැයි සම්මත කුලවල අයටද ලැබී තිබුණ එකම කුලයක් සිටින ගම්වල ඇතැම් විට කුලයේ වැදගත් කෙනෙකුට එවැනි තනතුරු පිරිනැමී ඇත. ඔවුන් තවමත් මහදුරයා යනුවෙන් වලින් හඳුන්වා ඇත. අධිකාර, සෙනෙවිරත්, ඇපා, - එසේ මහලක්ඛණ- මහරටිනා, අනුනායක- යහාපතිනා- සිටුනා- ටුලේනා- වියත්තා මහ වෙදනා, මහ නැකතියා, දහම්පසන්නා, ආදී නිලතල දරුවෝද වූහ . ඇතැම් නිලයක් සම්බන්ධව රාජකාරියට අනුව ගම්වරලැබී තිබුණ. නිලතල දරුවන්ගේ සේවය කරන අයට පවා ගම්වර ලැබී තිබුණ. විහාර හා දේවාල වල සේවය කරනවුන් සඳහාද රජය මගින් ගම්වර දී තිබුණි.

මෙම ලක්ෂණය බෙලිගල්කෝරළයේහිද ප්‍රචලිත වූවකි. බෙලිගල්කෝරළයේ අග්දර ගමේහි අදත් වර්ෂාන් පාසා අපූර්ව දෙවියන් සඳහා පෙරහැර පවත්වයි. මේ සඳහා දේව-
-ලය සතු ඉඩම් ගම්වාසීන් භුක්ති විඳින අතර වසරක් පාසා පන්දම් ඇල්ලීම බෙරහැසීම -
ආදිතේවාවන්ද කරති. මෙයටම තවත් උදාහරණයක්ද දැක්විය හැකිය. වසරක් පාසා වෙසක්
පොහෝ දිනයන්හි බෙලිගල අවට ගම් ගණක ජනයා විසින් පෙරහර තනක් කළ යුතුවේ. මෙය
දැඩිදෙනි පුග්ගේයිට අද දක්වාම නොපිරිහෙලා ඉටුවන කාර්යක් වන අතර ඒ සඳහා බෙලි-
-ගල විහාරයට වෙන්කොට ඇති ඉඩම් භුක්ති විඳින පිරිස පන්දම් ඇල්ලීම බෙරහැසීම වැනි-
-තේවාවන් අදත් ඒඅයුරින්ම ඉටු කිරීමට බැඳී සිටිති.

රජයේ නීතිරීති වලට පටහැනි වුවත්ටත් බදු ගෙවන්නන්ටත් හොර මැ-
-රෙන්ම් ආදිය කරණවුන්ටත් දුන් දඬුවම්වල රාශියක් පැරණි සිංහල පාලනය තුළින් උපුටා
ගත හැකිය. උල සිටුවීම ඇතුන් ලවා පා ගවා මැරවීම හිසමත බර පැටවීම, කටු බෙ-
-රයේ තැබීම සතුන් වෙත ඇද දැමීම දෙකකුල් හස් දෙකක බැඳ හස් දෙක දෙපසට කපා හැරීම
-චැනි දඬුවම්[1] ඉන්ස මහරකි. බෙලිගල් කෝරළයේද මේවා ක්‍රියාත්මක වූ බැව් ජනප්‍රවාද වලි
-න් පැවසේ බෙලිගල විහාරය අසල පදිංචි ගම් වැසියන්[2] විසින් හෙළ කළ එවැනි ජන ප්‍රවාදය
-ක් මෙසේය.

" . . . . බෙලිගල් පුරේ රජකළ ඉසුරු සිංහල රජවරුන්ගේ කාලෙත් අද
වගේම මහා ඉහළින් වෙසක් පෙරහැර ප්‍රජාව හිබුණාලු ඇතුලවිත්ත ඉඩමේ හිබුණ ඇත්ගාලෙන්
මුදා ගත් ඇතුන් නාවා පෙරහරට ගෙන ඒම ඒකාලේ සිරිතක් මේ ඉරහැරේ ගමින් ගත් ඇතෙක්
ජය සිරිමා හාමුදුරුවන්ගේ ගාබාවත් කඩා කැවාලු පෙරහැරේ ගමින් කරද්දි ඒ අත්ත කාලා ඇතා
-ට මඑවෙන් පිටතට යන්න බැරිවුනාලු ලේ වමනය දමන්නට පටන් අරගෙන තියනවා, පස්සේ -
ඇතා පිස්සුවෙන් වගේ දුවගෙන ගිහින් කටු කුරුන්දේ හිබෙන / අඩි ලේල්ලව කියන තැන ලේ
වමාරා මැරී වැටුනලු. ඒක නමයි අද කටුකරුන්දේ ඒ තැනට ලේල්ලව කියන්නේ මේ ඇතා-
-ගේ ඇත්ගොඩාව, විදියට හිටියෙ පදු මීනිහෙක්. රජ තුමාගේ පදුවා කැඳවා ඒට පසුවදාම උල
තබා මැරුවලු. පද්දා උල නම් ස්ථානය අදත් ඒ නමින් හැඳින්වේ/ඇතිවුණේ ඒ විදියටයි. මේ
ජනප්‍රවාදයන්හි පැහෙන අදහස කෙසේ වෙතත් පැරණි සිංහල රාජ්‍ය සම්ප්‍රදායන්හි සත්ත්ව දඩුව
-ම් හා පාලන විධි බෙලිගල්කෝරළය තුළද ඒඅයුරින්ම ක්‍රියාත්මක වූවා යැයි සිතිය හැකිය.

---

1. සිංහල සමාජ සංවිධානය - මහාචාර්ය ලියන්සු විරසිංහ.

2. ආර්. පී. වූල්ෆ් මුහුදු (1825) කුඩල්ගම බෙලිගල.

විදේශියයන් මෙරට පාලන බලය අත්කර ගැනීමෙන් පසු මෙතෙක් තිබුණ සිංහල රාජ්‍ය පාලන නීති රීතිවා කුම සම්ප්‍රදායන්ම වෙනස්ව ගිය බව ඓතිහාසික තොරතුරු-ඇසුරෙන් අපට හෙළි වේ. බුදු සමයෙන් ගිහිමිහ ලත් බොහෝ පාලන නීති රීති සම්ප්‍රදාය-යන්ම වෙති, මුහුණුවරක් ගති. පෘතුගීසි ලන්දේසි ඉංග්‍රීසි යන ජාතිකයෝ කුමයෙන් තම තම-න් උරුමකම් කි සංස්කෘතිය ආගම් හා පාලන කුම ව්‍යාප්ත කිරීමට නොමද උත්සාහයක් ගත්හ. මෙහි ප්‍රතිඵලය වුයේ කාලයාගේ ඇවෑමෙන් එම විදේශීය සංස්කෘතිය ආගම හා පාලන කුම සිංහල රාජාණ්ඩු කුමය ගිල ගැනීමය. එහෙත් බෙලිගල්කෝරළය තුළට එම බල පෑම් සිදුවී ඇත්තේ මඳ වශයෙන් යයි කිව හැකිය. විදේශීය ආගමික සංකල්පයන්ට අවනත-වූ පිරිස් බෙලිගල් කෝරළය තුළ ඇත්තේ ඉතාමත් අඩුවෙනි. එම සුළු පිරිසත් ඇතැම් විට වෙළඳාම ආදී කටයුතු සඳහා වෙනත් ප්‍රදේශවල සිට සංකුමණය වුවන් වශයෙන් හැකින්වී ය හැකිය.

විශේෂයෙන් ලංකාවේ නිරිත දිග තෙත් කලාපයේ ව්‍යාප්තව පැවති, විදේශිය-න්ට ලාභයගිත ආදායම් මාර්ග සලසා දුන් කරාබු සාදීකම, එනසාල්, ගම්මිරිස් ආදී තැවු-බඩු වර්ග නිසා මෙම පලාත් කෙරෙහිම ඔවුන්ගේ අවධානය යොමුවී තිබුණි. විදේශීය පාලක-යෝ ආර්ථික ලාභ තකා මෙරට එවකට පැවති පාලනනීති රීති හා කුම උපයෝගී කොට ගත්හ. ඒ පැරණි කල ක්‍රියාත්මක වූ රාජකාරී කුමය ඔවුන් එසේ යොදා ගති. විදේශීය පාලන කුමය අපට වැදගත් වන්නේ නූතන පාලනය සතස් කිරීම සඳහා එමගින් කළ බලපෑම් නිසාය. ලන්දේසීන් විසින් මෙහි ක්‍රියාත්මක කළ රෝම ලන්දේසි නීතිය අදත් අපරට අධිකරණය තුළ විශේෂ-තැනක්ගෙන සිටී. නූතන පාලන කුමය ක්‍රියාත්මක වන ඇතැම් නිලතල - නිලතල නාම-ස්ථාන-නාම විදේශීය පාලනය තුළින් උපුටා ගත් ඒවාය. වෙනත් අයුරකින් කිවහොත් නූතන පාලනය විදේ-ශීය පාලන කුමයන්ගේ විකාශනයකි.

පොදුවේ මූල් ද්වයින පුරා විහිදුන මේ ණීතාශිත පාලන තන්ත්‍රයේ පලාත් - පාලනය පවතිනුයේ කව්වේරිය නම් ආයතනය කේන්ද්‍රකොට ගෙනය. කව්වේරිය සම්බන්ධකොට-විහිදුන අනෙක් පාලන ඒකකයන් මගින් අද බෙලිගල් කෝරළයද පාලනය වේ. පහත සඳහන් සටහන් මගින් එය තවදුරටත් පැහැදිලි වේ.

කව්වේරිය

ලියදිනාතකි

ලියාවිල.

ඇඹෙන්වල

තොලුනිය - පාමිණකාව

කොඹන්ඩවලය.